**ශීර්ෂය 104 - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 104 - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 23 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තා පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත

සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ ගිණුම්කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127(1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත්බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම. | 2.3 |
| | | 3. අභ්‍යන්තර විගණනයේ අඩුපාඩු | 2.8 |
| | | 4. සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම. | 2.5 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැයවිෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරිම සඳහා වන යෝජනා සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදි තියුණු පරික්ෂාවකට භාජනය කිරිම. | 1. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනිම. | 2.1.2 |
| | | 2. දේශීය ආධාර ව්‍යාපෘතිවල අඩුපාඩු | 2.2 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකිවන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබිම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.4<br>2.4(ආ) |
| | | 2. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවැතිම. | |
| | | 3. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරිම. | 2.4(ඇ) |

| | | | |
|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.7 |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.6 |
| 127(7) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදුවී ඇති අවස්ථා වලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසි වල නියම කර ඇති කාර්ය පටිපාටිය ගණන් දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම් වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිළි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | රජයේ නිලධාරීන්ගේ ඇප | 2.10 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටුකළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 21 ක් පැවැති අතර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන 17කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). ක්‍රියාකාරී සැලැස්මේ, අමාත්‍යාංශයේ අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් 21ක් දක්වා තිබුණද එම කාර්යයන්ට අනුරූපී ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. එම නිසා අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්වල ප්‍රගතිය පිළිබඳව විගණනයට අදහස් දැක්විය නොහැකි විය.

(ආ) 2017 දෙසැම්බර් 30 දිනට සංශෝධනය කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2018 ජනවාරි 09 දින විගණනයට ඉදිරිපත් කරන ලදි. එම සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන කාර්යභාරයන් සඳහන් කිරීමේදි 2017 ජුනි 09 දිනැති හා අංක 2022/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් කරන ලද සංශෝධන සැලකිල්ලට ගෙන නොතිබුණි.

#### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

**අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූල්‍ය නගරය ව්‍යාපෘතිය සඳහා 2017 අයවැය ඇස්තමේන්තුවෙන් රු. මිලියන 200 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම ව්‍යාපෘතිය යටතේ හඳුනාගන්නා ලද කාර්යයන් ඉටුකිරිම සඳහා 2016 වර්ෂයේදි රු.මිලියන 71.34 ක් ආයතනයක් වෙත ලබාදී තිබුණි. විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 22.37 ක් පමණක් වියදම් කර රු. මිලියන 48.94 ක් ඉතිරිව තිබුණි. එසේ වුවද, 2018 වර්ෂයේ වියදම් සඳහා අමාත්‍යාංශය මගින් 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී රු. මිලියන 100 ක්, ඉහත ආයතනයට ලබා දී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික මූල්‍ය ආයතක තැන්පත්කරුවන් වෙත මුදල් ගෙවීම සඳහා පරිපූරක ප්‍රතිපාදන මගින් රු.මිලියන 3,555.10 ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනවන විට එයින් රු. මිලියන 2,500 ක් උපයෝජනය කර තිබිණි. තුන්වන අදියර යටතේ රු.මිලියන 10 ට වැඩි තැන්පත්කරුවන් 472 කට මුදල් ගෙවීමට ඉලක්ක කර තිබූ නමුත් තැන්පත්කරුවන් 412 ක් සඳහා පමණක් මුදල් ගෙවා තිබිණි. කෙසේ වුවද, 2015, 2016 හා 2017 අදියර තුනක් යටතේ රු. මිලියන 7,489.9 ක් මුදල් නිදහස් කර තිබුණද 2018 ජුනි 04 දින වන විටත් ඉන් තැන්පත්කරුවන් සඳහා ගෙවා තිබුණේ රු.මිලියන 7,342.7 ක් පමණක් බව විගණනයට නිරීක්ෂණය විය.

### 2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය ආධාර ව්‍යාපෘති

(අ) 2016 සැප්තැම්බර් මස 28 දිනැති හා අංක අමප/16/1810/702/061 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මධ්‍යම වැඩසටහන් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීමට සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ මැකෙන්සි සහ සමාගම සේවයේ යොදවා ගැනීම හා ඒ වෙනුවෙන් අමෙරිකානු ඩොලර් මිලියන 2.3 ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. එසේම ඒ තුළින් සිදු කරන ලද ආර්ථික ප්‍රතිඵල අත්කර දීමේ වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය තුළදී

රු.මිලියන 466.45 ක වැයකර තිබුණි. තවද ගිවිසුම ප්‍රකාරව සංවර්ධන නියෝජිතායතනයක් ස්ථාපිත කල යුතු වුවද එම ආයතනය නීත්‍යානුකූලව ස්ථාපිත කර නොතිබුණි. එහෙයින් එම නියෝජිතායතනය විසින් ඉටුකල යුතු කාර්යයන් ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

(ආ) 2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

------------------------------------------------

2017 අයවැය යෝජනා යටතේ මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාවට නැංවීම සඳහා යෝජනා 05 ක් ඉදිරිපත් කර තිබූ අතර මේ සඳහා රු. මිලියන 22,300 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් හානි සිදු වූ දේපල ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීම වෙනුවෙන්, ශ්‍රී ලංකා EXIM බැංකුව ස්ථාපිත කිරීම සඳහා වෙන් කරන ලද රු. මිලියන 10,000 එම කාර්යය සඳහා යොදා නොගන්නා ලෙස භාණ්ඩාගාරය දන්වා තිබීම හා ප්‍රාදේශීය නායකයින් බල ගැන්වීම සඳහා විශේෂ අරමුදලක් ස්ථාපිත කිරීම සඳහා වෙන් කරන ලද රු. මිලියන 300 ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් එම ප්‍රතිපාදන අවුරා තැබීම නිසා එම යෝජනා දෙක ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) අයවැය යෝජනා යටතේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ සඳහා රු. මිලියනයක් බැගින් ලබාදී තෝරාගත් තරුණ ව්‍යාපාරිකයින්ට පොලී රහිත ණය පහසුකම් ලබාදීම සඳහා වූ රු. මිලියන 7000 ක ප්‍රතිපාදන, එම ව්‍යාපෘතිය වෙනුවට ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගෙන තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනවන විට රු. මිලියන 5766.8 පමණක් උපයෝජනය කර තිබුණි.

(iii) අපනයන ප්‍රසාරණය, සංචාරක සහ සෘජු විදේශ ආයෝජන ගෙන්වා ගැනීම සඳහා වූ රු. මිලියන 1,000 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 900 ක් ආපදා කටයුතු සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිදහස් කර තිබුණි. අනතුරුව ඉතිරිවූ රු. මිලියන 100 ප්‍රතිපාදනවලින් 2017 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණේ රු. මිලියන 17 කි.

**2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

**------------------------------------------------------------**

**ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම**

**--------------------------------**

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.1 (ආ) (ඇ) සහ (ඉ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය වුණි. තවද ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කළ බව තහවුරු නොවිණි.

(අ) ප්‍රසම්පාදන සැලැස්මේ පළමු කරුණ වන ප්‍රසම්පාදන වර්ගය සඳහන් කිරීමේදී භාණ්ඩ, වැඩ හා සේවා වශයෙන් වෙන්කර, එක් එක් වර්ගයට අයත්, අයිතම වෙන් වෙන් වශයෙන් දක්වා ඊට අදාළ වටිනාකම දැක්විය යුතු වුවත්, එසේ කර නොතිබුණු අතර වාර්ෂික ඇස්තමේන්තුවෙන් එක් එක් වැය විෂය වෙනුවෙන් වෙන් කර තිබූ ප්‍රතිපාදනය පමණක් දක්වා තිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී සැලසුම් කළ ලංසු නිවේදන දිනය නිශ්චිතව දැක්විය යුතු වුවත් එවැනි දිනයක් සඳහන් කර නොතිබූ අතර පළමු කාර්තුව වශයෙන් සඳහන් කර තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදනය අවසන් කිරීමට නියමිත දිනය දැක්විය යුතු වුවත් එහි දක්වා තිබුණේ 4 වන කාර්තුව යනුවෙනි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදි ලෙස සකස් නොකිරීම නිසා ප්‍රසම්පාදන කාර්යයන් සත්‍ය වශයෙන් ඉටු කර ගැනීමෙන් පසු සැලැස්ම

සමඟ සංසන්දනය කිරීමට නොහැකි වන අතර පාලන කාරකයක් ලෙස යොදා ගැනීමටද නොහැකි වී ඇත.

(ඇ) වර්ෂය තුළ අමාත්‍යාංශයේ සිදු වූ වෙනස්කම් අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර නැවත ඉදිරිපත් කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර නැවත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

**(අ) වාහන උපයෝජනය**

මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය සතු වාහනවලින් වෙන්කළ වාහන ලෙස සඳහන් කරන ලද වාහන 06 ක් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ට වෙන්කර ඇති අතර එම වාහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 1,123,112 ක් වියදම් කර තිබුණි.

(ii) අමාත්‍යාංශය සතු වාහනවලින් වෙන්කළ වාහන ලෙස භාවිතා කරන වාහන 03 ක් තරුණ සේවා සභාවට අයත් වාහන බව නිරීක්ෂණය වුණි.

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(i) අංක 01/2018 හා 2018 මාර්තු 19 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය හා අංක 02/2015 හා 2015 ජුලි 01 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදයේ විධිවිධානවලට අනුව අපහරණය කලයුතු යැයි හඳුනා ගන්නා වාහන චක්‍රලේඛ දිනයේ සිට මාස 03 ක් ඇතුළත අපහරණය කර අවසන් කිරීමට කටයුතු කිරීම සියළුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ/ ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. 2015 වර්ෂයේ සිට එනම්, පෙර පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රැගෙන විත් තිබූ එවකටද ධාවනයෙන් ඉවත් කර තිබූ වර්තමානයේ මෙම අමාත්‍යාංශයට අයත් යතුරුපැදි 03 ක්ද නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ත්‍රීරෝද රථයක්ද, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයට අයත් කාර්රථයක් සහ වෑන් රථයක්ද, 2015 වර්ෂයේ සිට ධාවනයන් ඉවත් කර තිබූ නමුත් 2018 මාර්තු 31 දින වන විටත් එම වාහන සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ බව විගණනයේදි නිරීක්ෂණය විය.

(ii) නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය සතු වූ පැජරෝ රථයක් 2015 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණි. මෙම රථයේ ලියාපදිංචි සහතිකය සහ ආදායම් බලපත්‍රය නොමැති බවත් මෙම අංකය යටතේ තවත් වාහනයක් ලියාපදිංචි වී තිබීම හේතුවෙන් මෙම වාහනය ධාවනය කිරීමට නොහැකි වී ඇති බවත් නිරීක්ෂණය විය. 2015 වර්ෂයේ සිට අවුරුදු 03 කට ආසන්න කාලයක් ගතවී තිබුනද මේ සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික පියවර ගෙන නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

අංක 02/2017 හා 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය අනුව රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින්ම ලියාපදිංචි කල යුතු වුවද අමාත්‍යාංශයට අයත් වාහන 79 ක් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම.**

2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අමාත්‍යාංශය ස්ථාපිත කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 03 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරික්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2015 | පුනරාවර්තන | 2,120.7 | 1,925.4 | 195.3 | 9.2 |
| | මූලධන | 13,261.6 | 10,900.7 | 2,360.9 | 17.8 |
| | **එකතුව** | **15,382.3** | **12,826.1** | **2,556.2** | **16.6** |
| 2016 | පුනරාවර්තන | 2,025.4 | 1,938.0 | 87.4 | 4.3 |
| | මූලධන | 31,193.6 | 20,856.2 | 10,337.4 | 33.1 |
| | **එකතුව** | **33,219.0** | **22,794.2** | **10,424.8** | **31.3** |
| 2017 | පුනරාවර්තන | 2,226.1 | 2,100.9 | 125.2 | 5.6 |
| | මූලධන | 47,818.9 | 25,137.3 | 22,681.6 | 47.4 |
| | **එකතුව** | **50,045.0** | **27,238.2** | **22,806.8** | **45.57** |

**සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනුලැබේ.

(අ) අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලස්වාගෙන තිබූ එකතුව රු.2,200,000 මූලධන වැය විෂයයන් පහක ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගෙන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) 2017 ජනවාරි 20 හා 2017 මාර්තු 24 දිනයන්හිදී රු.මිලියන 10,000 හා රු.මිලියන 300 වශයෙන් අතිරේක ප්‍රතිපාදන මඟින් ප්‍රතිපාදන සලස්වාගෙන තිබූ මූලධන වැය විෂයයන් දෙකකට අදාළ රු.මිලියන 10,300 ප්‍රතිපාදන එම යෝජනා දෙක ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මුලා ප්‍රතිපාදනය අහුරා තැබීම නිසා සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.1,200,000 ප්‍රතිපාදනයෙන් රු. 880,000 ක් මු.රෙ. 66 මාරුකිරීම් යටතේ වෙනත් වැය විෂයකට මාරුකළ පසුත් වර්ෂය අවසානයේ රු.320,000 ක් එනම් සියයට 100 උපයෝජනය නොකොට ඉතිරි වී තිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 06 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 10 ක මුලු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් දක්නට ලැබුණි.

(ඉ) වැය විෂයයන් හතරක් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් රු.3,000,000 ප්‍රතිපාදන සලස්වාගෙන එම ප්‍රතිපාදන මුළු ප්‍රමාණයම මු.රෙ. 66 මාරුකිරීම්වලින් වෙනත් වැය විෂයයකට මාරු කිරීම් කර තිබුණි.

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 10401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 35 | 33 | 12 | 14 | 100 | 69.2 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 2,781,358 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ තුළ වර්ෂ 5 කට වැඩි කාල පරාසයක සිට පැවැත එන රු. 2,687,305 ක ණය ශේෂ වූ අතර එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 2.7 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් තුනක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. 81,407,558 ක් විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට වන පොදු තැන්පතු ගිණුම් 2 ක් යටතේ වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 (04) (ඇ) ප්‍රකාරව එකතු කරනු ලබන ආදායම් රැස් කිරීමේ ගිණුම්වල හෝ තැන්පත් ගිණුම්වල තබා නොගෙන එක් එක් මාසය අවසානයේදී තැන්පතු ගිණුමේ ශේෂය තිබේ නම් එළැඹෙන මාසයේ පළමු සතිය තුල ඒ ඒ ආදායම් විෂය යටතට ගත යුතු වුවත් ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ බාහිර වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම මගින් 2017 වර්ෂයේ ලද ආදායමින් රු. 1,546,851 ක් 6000-0-0-13-99 දරන තැන්පතු ගිණුමේ 2017 දෙසැම්බර් 31 දින වන විටත් පැවති බව නිරීක්ෂණය විය.

## 2.8 අභ්‍යන්තර විගණනය

2017 වර්ෂය සඳහා අනුමත කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව මෙම අමාත්‍යාංශයට අදාළව ප්‍රධාන කාර්යයන් 16 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, ඉන් ක්‍රියාකාරකම් 03 ක් එනම් කාර්ය මණ්ඩල පුහුණුව, වැටුප් හා වේතන, ප්‍රසම්පාදන කටයුතු යන ක්‍රියාකාරකම් ඉටුකර ගෙන නොතිබුණි.

**2.9** **මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම්**

(අ) අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 270 ක් වැය කර තිබුණි. ඒ අනුව වාර්ෂික ඒක පුද්ගල වියදම රුපියල් 525,060 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 83 | 63 | 20 |
| (ii) | තෘතීය මට්ටම | 155 | 91 | 64 |
| (iii) | ද්විතික මට්ටම | 256 | 236 | 20 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 137 | 122 | 15 |
| (v) | වෙනත් | 6 | 3 | 3 |
| | **එකතුව** | **637** | **515** | **122** |

**(ආ)** **කාර්ය මණ්ඩල පුහුණු කිරීම**

(i) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම - 2017 අනුව කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා ප්‍රධාන ක්‍රියාකාරකම් 5 ක් යටතේ දක්වා තිබුණද, කාර්ය සාධන ඇගයීම කලහැකි වන පරිදි කාර්ය සාධන දර්ශක, එනම් පුහුණු වැඩසටහන් සංඛ්‍යාව, පුහුණුව ලබාදෙනු ලබන නිලධාරීන් සංඛ්‍යාව යනාදි විස්තර දක්වා නොතිබුණි. කෙසේ වුවත් ක්‍රියාකාරී සැලැස්ම අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණ අතර පුහුණු අවශ්‍යතා හඳුනාගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණ අතර හඳුනාගත් පුහුණු අවශ්‍යතා අනුව විස්තරාත්මක සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශය රු. මිලියන 12.6 ක් කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා සඳහා 2017 අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට රු. 2,546,360 ක් වැය කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 20 ක් බව නිරීක්ෂණය විය.

(iii) තවද, අමාත්‍යාංශයේ තථ්‍ය කාර්ය මණ්ඩලය 515 ක් වූ අතර ඉන් දේශිය හා විදේශිය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වි ඇති කාර්ය මණ්ඩලය 127 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේදි කිසිදු පුහුණුවීම් අවස්ථාවක් නොලද කාර්ය මණ්ඩලය 388 ක් බව නිරීක්ෂණය විය.

**2.10** **රජයේ නිලධාරීන් ඇප තැබීම**

මුදල් රෙගුලාසි 880 සඳහන් විධි විධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.